# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2363/06 - 2023 දෙසැම්බර් මස 18 වැනි සඳුදා - **2023.12.18**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය: 11/3/3/1/14H/1.
ඉඩම් අමාත්‍යාංශයේ අංකය : LD/05/2008/MV/408F.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය වන පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :-

මෙහි මහජන කටයුත්තක් යනු මොරගහකන්ද හා කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත් කරගැනීම වේ. :

මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ, ලග්ගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ලග්ගල පල්ලේසිය පත්තුවේ E 396B අකරහැඩිය ග්‍රාම නිලධාරී වසමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් 2023.03.10 දින සම්මත කරන ලද, ක. සි. 310243හි, කලාප අංක 22හි, පත්‍ර අංක 1 දරන සැලැස්මේ බිම් ප්‍රමාණය 22.1279ක් වන පහත විස්තර සඳහන් ඉඩම.

01. **කැබලි අංක 2**

ඉඩමේ නම : අලියාවැටුන හේන්යාය**;** විස්තරය : කුඹුරු. මාර්ග, ඇළ මාර්ග යනාදිය (පැරණි හේන)**;** හිමිකම් කියන අය : රජය**;** මුල් හිමිකම්පාන්නා: සොයාගත නොහැක**;** ප්‍රමාණය: හෙක්ටයාර් 22.1279.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2024.02.12 වැනි දින පෙ.ව. 9.00ට ලග්ගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2024.02.05 වැනි දිනට මත්තෙන්, ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

එස් විජයකුමාර්,
ප්‍රාදේශීය ලේකම්,
ලග්ගල.

2023 දෙසැම්බර් මස 13 වැනි දින,
ලග්ගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 12-0264/1


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය: 11/3/3/1/14H/1.
ඉඩම් අමාත්‍යාංශයේ අංකය : LD/05/2008/MV/408F.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය වන පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩම් විස්තර :-

මෙහි මහජන කටයුත්තක් යනු මොරගහකන්ද හා කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත් කරගැනීම වේ. :

මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ, ලග්ගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ලග්ගල පල්ලේසිය පත්තුවේ E 396B අකරහැඩිය ග්‍රාම නිලධාරී වසමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් 2023.03.10 දින සම්මත කරන ලද, ක. සි. 310243හි, කලාප අංක 16හි, පත්‍ර අංක 1 දරන සැලැස්මේ බිම් ප්‍රමාණය 34.2007ක් වන පහත විස්තර සඳහන් ඉඩම්.

01. කැබලි අංක 1

ඉඩමේ නම : අලියාවැටුන හේන්යාය; විස්තරය : කුඹුරු. මාර්ග, ඇළ මාර්ග යනාදිය (පැරණි හේන); හිමිකම් කියන අය : රජය; මුල් හිමිකම්පාන්නා: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්ටයාර් 0.7602.

02. කැබලි අංක 2

ඉඩමේ නම : දඹලේවෙල, දඹලේවෙල කමත; විස්තරය : කුඹුරු, මාර්ග, ඇළ මාර්ග යනාදිය (පැරණි කමත හා කුඹුර); හිමිකම් කියන අය : රජය; මුල් හිමිකම්පාන්නා: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්ටයාර් 0.6764.

03. කැබලි අංක 3

ඉඩමේ නම : අලියාවැටුන හේන්යාය; විස්තරය : කුඹුරු. මාර්ග, ඇළ මාර්ග යනාදිය (පැරණි හේන); හිමිකම් කියන අය : රජය; මුල් හිමිකම්පාන්නා: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්ටයාර් 25.8367.

04. කැබලි අංක 5

ඉඩමේ නම : අලියාවැටුන හේන්යාය; විස්තරය : කුඹුරු. මාර්ග, ඇළ මාර්ග යනාදිය (පැරණි හේන); හිමිකම් කියන අය : රජය; මුල් හිමිකම්පාන්නා: මහවෙල, පල්දෙනිය පදිංචි උපතිස්ස වාසල ශ්‍රී නාම සේනානායක බණ්ඩාරලාගේ කමල්දේවි මානිංගමුව, මහවෙල, පල්දෙනිය පදිංචිව සිට මියගිය උපතිස්ස වාසල ශ්‍රී නාම සේනානායක බණ්ඩාරලාගේ ඥානචන්ද්‍ර මානිංගමුව සහ මහවෙල, පල්දෙනිය පදිංචි උපතිස්ස වාසල ශ්‍රී නාම සේනානායක බණ්ඩාරලාගේ සරෝජිනී මානිංගමුව; ප්‍රමාණය: හෙක්ටයාර් 6.9274

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2024.02.12 වැනි දින පෙ.ව. 9.00ට ලග්ගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2024.02.05 වැනි දිනට මත්තෙන්, ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම් ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

එස් විජයකුමාර්,
ප්‍රාදේශීය ලේකම්,
ලග්ගල.

2023 දෙසැම්බර් මස 13 වැනි දින,
ලග්ගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 12-0264/2

---

## 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය: KDS/MDB/4/2/1/249.
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය : 4-3/18/2020/WS/98.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ (පනතේ 460 පරිච්ඡේදය) 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩම/පරවශතාවේ විස්තර :-

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 756 දරන ගිඩ්ඩව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ගිඩ්ඩව ගමේ පිහිටි සර්වේයර් ජනරාල් වෙනුවෙන් මහනුවර දිස්ත්‍රික්කයේ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් මැන සකස් කර අනුමත කරන ලද 2023.03.31 වැනි දිනැති ක.සි. 320895 දරන මූලික පිඹුරේ කැබලි අංක 02 වශයෙන් දැක්වෙන, මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0126 (පර්චස් 05)ක් පමණ වන මාතලාවේකුඹුර හෙවත් මඩුවේගෙදර කුඹුර නමැති පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස.

01. කැබලි අංක 2

ඉඩමේ නම : මාතලාවේකුඹුර හෙවත් මඩුවේගෙදර කුඹුර; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0126.

ඉඩමේ මායිම

උතුරට : හුළඟග සහ ගිඩ්ඩව (කොටසක්); නැගෙනහිරට: ගිඩ්ඩව (කොටසක්); දකුණට : ගිඩ්ඩව කොටසක් සහ හුළු ගඟ; බටහිරට : හුළු ගඟ

හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනයන් -

1.ඊ. එම්. එම්. ජී. එස්. කේ. ඒකනායක මහත්මිය,
අංක 72/3, මාතලාව, ගිඩ්ඩව, පුටුහපුව.

2. ඊ. එම්. එම්. ජී. ඒ. කේ. ඒකනායක මහත්මිය,
අංක 256, බෝතොට පාර,
මැදවල, හාරිස්පත්තුව.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2024 මාර්තු මස 25 වැනි දින පෙ.ව. 11.30 ට මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2024 මාර්තු මස 18 වැනි දිනට මත්තෙන්, ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම් ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. අයිතිවාසිකම් තහවුරු කිරීම පිණිස අදාළ ඔප්පු සහ ලියකියවිලි ආදිය පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුයි.

යූ. පී. ඉන්දික අනුරුද්ධ පියදාස,
ප්‍රාදේශීය ලේකම්,
මැදදුම්බර.

2023 දෙසැම්බර් මස 12 වැනි දින,
මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 12-0265/1

---

## 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය: KDS/MDB/4/2/1/248.
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය : 4-3/18/2020/WS/97.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 පරිච්ඡේදය) 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර :-

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 757 දරන අම්බලගල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ මැදගම්මැද්ද ගමේ පිහිටි සර්වේයර් ජනරාල් වෙනුවෙන් මහනුවර දිස්ත්‍රික්කයේ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් මැන සකස් කර අනුමත කරන ලද 2023.04.19 වැනි දිනැති ක.සි. 320896 දරන මූලික පිඹුරේ කැබලි අංක 01 වශයෙන් දැක්වෙන, මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.2529 (පර්චස් 20)ක් පමණ වන හුළුගහ වත්ත නමැති පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස.

**01. කැබලි අංක 1**

ඉඩමේ නම : හුළුගහවත්ත; ප්‍රමාණය: හෙක්ටයාර් 0.2529 (පර්චස් 20)

ඉඩමේ මායිම්
උතුරට : මැදගම්මැද්ද (කොටසක්); නැගෙනහිරට: මැදගම්මැද්ද (කොටසක්); දකුණට : මැදගම්මැද්ද (කොටසක්); බටහිරට : මැදගම්මැද්ද (කොටසක්)

හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනයන් -
මහාචාර්ය ඩබ්. අයි. අමරසිංහ මහතා,
අංක 64, අනිවත්ත පාර, මහනුවර

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2024 මාර්තු මස 25 වැනි දින පෙ.ව. 10.00ට මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, මාර්තු මස 18 වැනි දිනට මත්තෙන්, ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය. අයිතිවාසිකම් තහවුරු කිරීම පිණිස අදාළ ඔප්පු සහ ලියකියවිලි ආදිය පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

යූ. පී. ඉන්දික අනුරුද්ධ පියදාස,
ප්‍රාදේශීය ලේකම්,
මැදදුම්බර.

2023 දෙසැම්බර් මස 12 වැනි දින,
මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 12-0265/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.